# සමාජ පන්තිය සහ අධ්‍යාපනය

ටී.පී.එච්.එන්. අමරසූරිය

## හැඳින්වීම

අධ්‍යාපන විද්‍යා අධ්‍යයන විමර්ශිත ශාස්ත්‍රීය ග්‍රන්ථය වෙත ඉදිරිපත් කරන මෙම ලිපිය මගින් අධ්‍යාපන සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ අවධානයට ලක්වෙන අධ්‍යාපනය හා සමාජ පන්තිය යන ඒකාබද්ධ සංකල්ප දෙක පිළිබඳවත් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ එම සංකල්ප දෙකේ අන්‍යෝන්‍ය සබඳතාව පරික්ෂා කිරීමත් අපේක්ෂා කරයි. ඕනෑම සමාජයක අධ්‍යාපන ක්‍රියාවලියේ ස්වභාවය අදාළ සමාජයේ අධ්‍යාපන පරමාර්ථ, අරමුණු හා අවශ්‍යතා මත සකස් විය යුතු ය. අධ්‍යාපනය ක්‍රියාත්මක වන්නේ සමාජයක් තුළ වන බැවින් අධ්‍යාපනය හා සමාජය අතර බැඳීමක් ඇතිවන බව ජෝන් ඩුවී ද හඳුනාගෙන ඇත (ගලගම, 2016 :35). අධ්‍යාපනය මානව ක්‍රියාකාරකමක් වන අතර එය එය ඉතා සුවිශේෂී ක්‍රියාවලියකි. එය මානව සංහතියේ ආරම්භයත් සමග ආරම්භ වී මානව වර්ගයාගේ අවසානය දක්වා සිදුවන අඛණ්ඩ ක්‍රියාවලියකි (භාතියා, 1985: 35). අධ්‍යාපනඥයන්ගේ එවන් ප්‍රකාශ මගින් අධ්‍යාපනය හා සමාජය අතර පවතින ඓන්ද්‍රිය සම්බන්ධතාව මැනවින් පැහැදිලි කරයි. සමාජ පන්තිය හා අධ්‍යාපනය, සමාජ සචලනය හා අධ්‍යාපනය, සමාජ සමූහ හා අධ්‍යාපනය, සමාජ ස්තරායනය හා අධ්‍යාපනය ආදිය ද ඇතුළු ව තවත් ක්ෂේත්‍ර රාශියක් ඔස්සේ එම සබඳතාව විමර්ශනයට භාජනය වේ.

අධ්‍යාපන ක්‍රියාවලියේ දී සමාජ පන්තිය යන්න ඉගෙනුම් ලාභියාගේ සමස්ත ඉගෙනුම් ක්‍රියාවලිය දෙසට දැඩි බලපෑම් එල්ල කළ හැකි බලවේගයක් ලෙස ක්‍රියාත්මක වීම කවර යුගයක හෝ ක්‍රියාත්මක වූ සමාජ ක්‍රම තුළ දක්නට ලැබුණි. වර්තමානයේ ද එම තත්ත්වය ඒ අයුරින්ම ක්‍රියාත්මක වේ. ඉගෙනුම් ලාභියා සඳහා පාසලක් තෝරා ගැනීම, විෂය ධාරා තෝරා ගැනීම, විධිමත් අධ්‍යාපනයට ඇතුළත් වන්නේ ද, විධිමත් අධ්‍යාපනයෙන් නො ගිලිහී පැවතිය හැකි ද,

පශ්චාත් උසස් අධ්‍යාපනය ලබන්නේ ද ආදී වැදගත් අවස්ථා තීරණය කිරීමේ දී සමාජ පන්තිය යන සාධකය සෘජු බලපෑම් සිදු කරන බවට සමාජ යථාර්ථය සාක්ෂි දරනු ඇත.

රටක් වශයෙන්, ජාතියක් වශයෙන් තිරසාර සංවර්ධනයක් කරා අනාගත පරපුර අධ්‍යාපනිකව මෙහෙයවීමේ දී අධ්‍යාපනය කෙරෙහි සමාජ පන්තියේ බලපෑම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ සිට අධ්‍යාපන ක්‍රියාවලිය සමග සම්බන්ධ වන සියලු දෙනා විසින් අවබෝධ කරගත යුතු ය. එබැවින් මෙම ලිපිය මගින් පළමුව සමාජ පන්තිය, සමාජයේ ඇති ඒ හා සමාන අරුත් ජනනය කරන වෙනත් ආයතනවලින් වෙන් කර හඳුනා ගැනීමත්, දෙවනුව පුද්ගලයෙකුගේ අධ්‍යාපන ප්‍රවේශයේ සිට ඉදිරි කටයුතු සඳහා සමාජ පන්තිය ඇති කරන බලපෑමේ ස්වභාවයත් අනාවරණය කර ගැනීම අරමුණු කරයි.

**සමාජ පන්තිය**

සමාජ පන්තිය පිළිබඳ නිර්වචනවලට අනුව සමාජ පන්ති (Social Class) නිර්මාණය වීමට අදාළ සමාජයේ ජීවත්වන පුද්ගලයින් එම සමාජයේ ගැවසී ගත් සමාජ ආර්ථික සාධක හිමිකර ගන්නා වූ ප්‍රමාණ අනුව එම පුද්ගලයන් පන්තියකට ගොනු වන ආකාරය විස්තර විය. මෙලෙස සමාජයක සමාජ පන්ති නිර්මාණය සඳහා මූලික වන සමාජ ආර්ථික සාධක (Social Economic Status) ඒ අයුරින් ම අධ්‍යාපනයේ විවිධ අංශ කෙරෙහි ද විශාල බලපෑමක් එල්ල කරන ආකාරය පහත ඡේද මගින් අනාවරණය වේ.

සමාජයක වෙසෙන සමාන සමාජ, ආර්ථික තත්වයන් අත් කර ගන්නා මිනිසුන් කණ්ඩායමක් සමාජ පන්තියක් ලෙස අර්ථකථනය කෙරේ. තව ද සමාජ විද්‍යාත්මක න්‍යාය මගින් අවධාරණය කර දක්වන පරිදි ජන සංගණනයන් හිදී සහ සමාජ ස්තරායනය පිළිබඳ පැහැදිලි කිරීම්වල දී බහුල වශයෙන් භාවිතයට ගන්නා සමාජ පන්තිය යන්න අර්ථ දක්වා ඇත්තේ, සමාජ ආර්ථික වශයෙන් සමාන අවස්ථා අත්කර ගන්නා පුද්ගලයන්ගේ එකතුවක් සමාජ පන්තියක් වශයෙනි.

එම කණ්ඩායම හෙවත් ස්තරවල අනුක්‍රමික පිළිවෙළ අනුව ආර්ථික ශක්තිය පැවතිය හැකි ය. දේපළ හිමිකම හා ඉපැයීමේ

ශක්තියෙන් සමාජ පන්තිය ස්ථාවර වෙයි. ඒ අනුව සමාජ පන්තියක් යනු නිෂ්පාදන මාර්ගවලට එක හා සමාන සම්බන්ධතාවයක් දක්වන පිරිසක් ඇති සමාජ කණ්ඩායමක් ලෙස කාල් මාක්ස් පෙන්වා දී ඇත (ගලගම, 2016 :165).

19 වන සියවස ආරම්භයේ දී භාවිතයට එකතු වන සමාජ පන්තිය යන පදය එතෙක් සමාජය තුළ ප්‍රධාන ධුරාවලිය විස්තර කිරීමට හා ජනතාව කණ්ඩායම් වශයෙන් වෙන් කිරීම සඳහා භාවිත කළ පිළිවෙළ හා තත්ත්වය (Order and Rank) යන පද වෙනුවට එක් වූවක් ලෙස විස්තර වේ. 18 වන සියවස අග භාගය වන විට යුරෝපා සමාජයේ සිදු වූ කාර්මික විප්ලවයත්, දේශපාලන විප්ලවයත් හේතුකොට මෙතෙක් යුරෝපයේ පැවති වැඩවසම් සමාජ ආකෘතියට තිබූ වැදගත්කම හීන වෙමින් වාණිජමය හා කාර්මික වශයෙන් නව සමාජ ආකෘතියක් ආරම්භ වන අතර ඒ තුළ ද නිෂ්පාදන සාධක හිමි හා ශ්‍රමික වශයෙන් සමාජයේ මිනිසුන් කාණ්ඩගත විය. මෙලෙස මිනිස් සමාජයේ මිනිසුන් පන්තිවලට ගොනුවීම පුරාණ ග්‍රීසියේ නගර රාජ්‍ය තුළ මෙන් ම අධිරාජය, ගෝත්‍ර සහ වැඩවසම් සමාජ ක්‍රමයන් හි වැඩි තීව්‍රතාවයකින් ක්‍රියාත්මක වී ඇත. බොටමෝර් උපුටා දක්වන ගලගම පෙන්වා දෙන්නේ සමාජ පන්තිය එක් ස්තරායන ක්‍රමයක් බවත් ස්තරායන ස්වභාවය තීරණය කිරීම සඳහා කුල, ජාති, ආගම්, භාෂා වැනි විවිධ සාධක අතර සමාජ පන්තිය ද එක් සාධකයක් වන බවයි. ඒ අනුව බොටමෝර් හඳුන්වා දුන් සමාජ ස්තර හතර සඳහා අතීත සමාජයේ පැවති සමාජ පන්ති දායක වී ඇති බව පහත වර්ගීකරණයෙන් තහවුරු වෙයි.

1. වහල් නිවහල් බව - ග්‍රීසිය, රෝමය වැනි රාජ්‍යවල
2. ඉඩම් හිමිකම - යුරෝපයේ රජවරු පූජක, නිදහස්, වහල් බව
3. කුල ක්‍රමය - ඉන්දියාව බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර
4. සමාජපන්ති - විවෘත සමාජවල, ඉහළ, මධ්‍යම, පහළ

(ගලගම, 2016: 165).

බොටමෝර්ගේ ඉදිරිපත් කිරීමේ සඳහන් වන සමාජ පන්ති එනම් වහලුන් සහ වහල් හිමියන්, ඉඩම් හිමි රදළයන් හා ප්‍රවේණි දාසයන් භාරතයේ ක්‍රියාත්මක වූ කුල පදනම් කර ගත් සමාජ කණ්ඩායම් සහ විවෘත සමාජවල ක්‍රියාත්මක වූ ඉහළ, මධ්‍යම, පහළ වශයෙන් බෙදී ගිය සමාජ කණ්ඩායම් නියෝජනය කළ පිරිස් ජීවන අවස්ථා (Life Chances) භුක්ති විඳි ආකාරය විමසා බැලීමේ දී, එම සමාජ පන්ති ජීවන අවස්ථා ඉතා අල්ප වශයෙන් අත් කරගත් පිරිසක් බව තහවුරු වේ. ජීවන අවස්ථා තහවුරු කිරීමේ දී පුද්ගලයෙකු ලබන අධ්‍යාපනය ඉතා වැදගත් සාධකයක් වුවත් ඒවා නිසි පරිදි නොලද සමාජ කණ්ඩායම් නොහොත් සමාජ පන්ති ලෙස පැරණි සමාජ පන්ති හඳුනා ගත හැකි ය. සමාජ පන්ති නිර්මාණය වීම ඒවායේ ක්‍රියාකාරීත්වය හා පැවැත්ම පරික්ෂා කිරීමේ දී වහල් පන්තිය, ප්‍රවේණිදාස පන්තිය විවෘත සමාජ වල පහළ සමාජ පන්ති අධ්‍යාපන ක්‍රියාවලිය හා සම්බන්ධ වීම ඉතා පහළ මට්ටමක පැවති බව සනාථ වෙයි.

ජර්මන් ජාතික සමාජ විද්‍යාඥ මැක්ස් වේබර් (Max Weber) පෙන්වා දෙන ආකාරයට සමාජයේ සීමිත සම්පත් සඳහා වන සටනෙහි ප්‍රතිඵලයක් ලෙස සමාජ ස්තරය නොහොත් සමාජ පන්තිය ගොඩ නැගේ. වෙළෙඳපොළ ආර්ථිකයක සමාන තත්ත්වයක් දරන පුද්ගලයන් කණ්ඩායමක් සමාන ආර්ථික ප්‍රතිලාභ ලැබීම නිසා පන්ති නිර්මාණය වන්නේ යැයි වේබර් සලකයි. සමාන පන්ති තත්ත්වයක් දරණ පුද්ගලයෝ සමාන ජීවන අවස්ථා ද භුක්ති විඳිති. සමාජයේ තමන් ලබා ගැනීමට කැමති දෑ ලබා ගැනීමට ඇති හැකියාව කෙරෙහි ඔවුන්ගේ පන්ති තත්ත්වය බලපාන්නේය (ගුණවර්ධන, 1995: 48). මැක්ස් වේබර්ගේ (Max Weber) මෙම පැහැදිලි කිරීමට අනුව අධ්‍යාපන ක්‍රියාවලියේ දී ද පුද්ගලයෙකු නියෝජනය කරන සමාජ පන්තිය එම පුද්ගලයා ලබන අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය තීරණය කිරීමට දායක වී ඇති ආකාරය වර්තමාන අධ්‍යාපන ක්‍රමයෙන් පිළිබිඹු වේ.

මෙලෙස එදා සමාජය තුළ ක්‍රියාත්මක වූ සමාජ පන්ති තහවුරු කිරීම පිළිබඳ මතවාදය නූතන කාර්මික සමාජ ක්‍රමයක් තුළ ද ජනතාව පන්තිවලට බෙදා දැක්වීමට තරම් ප්‍රබල වී ඇත. සමාජ පන්තිය හා

අධ්‍යාපනය යන මාතෘකා ඔස්සේ කරුණු පරීක්ෂා කිරීමේ දී සමාජ පන්ති යන සංකල්පය ඒ හා සමාන අරුත් දෙන වෙනස් සංකල්පවලින් වෙන් කොට හඳුනා ගැනීම කරුණු අවබෝධයට පහසු වනවා ඇත. සමාජ පන්තිය පිළිබඳ විස්තර වන සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ සමාජ පන්ති මෙන් ම සමාජ තත්ත්ව කණ්ඩායම් (Social Status Group, Status Class, Status State) ලෙස තවත් සමාජ පන්තියක් ක්‍රියාත්මක වෙයි.

ජර්මන් ජාතික සමාජ විද්‍යාඥ මැක්ස් වේබර් (Max Weber 1864-1920) විසින් ගොඩනගන ලද සමාජ ස්තරායන පිළිබඳ න්‍යායේ දී සමාජ තත්ත්ව කණ්ඩායම් (Status Class) මෙසේ අර්ථ දක්වා ඇත. සමාජයක ගෞරවය, කීර්තිය, ජනවාර්ගිකත්වය, ජාතිය සහ ආර්ථික නොවන ගුණාංග පදනම් කරගෙන සමාජයක් වෙනස් කළ හැකි පිරිසකි (Status Group Wikipedia https:en Wikipedia.org.wiki status group).

සමාජ තත්ත්ව කණ්ඩායම් (Status Group) මෙසේ අර්ථකථනය වන පසුබිමක සමාජ කණ්ඩායම (Social Group) සමාජ ආර්ථික පසුබිම තුළ ඒ ඒ පුද්ගල කණ්ඩායම් සෑම අංශයක් කෙරෙහි ම පැතිරුණු ජීවන අවස්ථා හිමිකර ගන්නා ස්වභාවය අනුව විස්තර වෙයි උදාහරණ ලෙස අප ජීවත් වන සමාජ සන්දර්භය තුළ ජීවත් වන මිනිසුන් ජීවන අවස්ථා (Life Chance) ලෙස හිමිකර ගැනීමට අපේක්ෂිත සෞඛ්‍ය පහසුකම් භුක්ති විඳීමේ දී අසාමාන්‍ය පරාසයක මිනිසුන් ඒවා භුක්ති විඳින අයුරු දැක ගත හැක. ජීවත් වීමේ අයිතිය රටේ මූලික නීතිය මගින් අවධාරණය කළ ද ජීවත් වීම සඳහා වන මූලික අවශ්‍යතා සපයා ගැනීම ට උත්සාහ ගැනීමේ දී ඒ ඒ පුද්ගල කණ්ඩායම් නියෝජනය කරන සමාජ පන්තිය තීරණාත්මක බලපෑමක් සිය අපේක්ෂණ කෙරෙහි එල්ල කරනු ඇත.

යහපත් ජීවන අවස්ථා ලබා ගැනීමට අධ්‍යාපනය තීරණාත්මක සාධකයක් වුව ද ඉගෙන ගැනීම සාධාරණ අයිතිවාසිකමක් ලෙස ප්‍රකාශ වුවත් එම අවස්ථා උදාකර ගැනීමේ දී තමන් නියෝජනය කරන සමාජ පන්තිය තීරණාත්මක සාධකයක් බවට පත් වී ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හයවන පරිච්ඡේදයේ රාජ්‍ය ප්‍රතිපත්තිය

මෙහෙය වීමේ මූලධර්මය හා මූලික යුතුකම් දැක්වෙන කොටසේ (උෟ) අනු ව්‍යවස්ථාව තුළ අධ්‍යාපනය පිළිබඳ මෙසේ සඳහන් ව ඇත. "නූගත්කම සහමුලින් ම තුරන් කිරීම සහ සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවකදීම සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්ථා ලබාගැනීමේ අයිතිය සහතික කිරීම" ( ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පී 17).

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක, සංස්කෘතික සංවිධානය හෙවත් යුනෙස්කෝ ආයතනය මගින් හඳුන්වා දෙන ලද සැමට අධ්‍යාපනය (Education for All) යන ගෝලීය ව්‍යාපාරය මගින් ද 2015 වර්ෂය වන විට සියලුම දරුවන්ගේ, තරුණයින්ගේ සහ වැඩිහිටියන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම අපේක්ෂා කරමින් වැඩසටහන් දියත් කරන ලදි. ජාතික වශයෙන් මෙන් ම ජාත්‍යන්තර මට්ටමින් අධ්‍යාපනය ජනගත කිරීම් සඳහා විවිධ ක්‍රියාමාර්ග, නීතිරීති, අණපනත් හඳුන්වා දී තිබුණ ද එම අරමුණු ප්‍රායෝගික තලයට ගෙන ඒමේ දී සමාජ පන්ති විසින් සිදුකරන බලපෑම සුළු කොට සිතිය නොහැක. ඒ අනුව මෙම ලිපිය මගින් සමාජ පන්ති හා අධ්‍යාපනය අතර පවතින සම්බන්ධතාව හා විවිධ ස්වරූපයේ අනුභූතික ව විමසා බැලීමට උත්සාහ කෙරිණ.

**අධ්‍යාපනය හා සමාජ ආර්ථික තත්ත්වය**

සමාජයක් තුළ වෙසෙන ජනතාව එම සමාජය තුළ පවතින සමාජ ආර්ථික සාධක හිමිකර ගන්නා ප්‍රමාණය අනුව ඔවුන් එම සමාජය තුළ ඉහළ පහළ මට්ටම් නැතිනම් සමාජ පන්තියකට (Social Class) උරුමකම් කියයි. එලෙස ඔවුන්ගේ සමාජ පන්ති නිර්මාණය කිරීමට දායක වූ සමාජ ආර්ථික සාධක ඔවුන්ගේ සමාජ පන්තිය නියෝජනය කරන පුද්ගලයන්ගේ අධ්‍යාපනය කෙරෙහි ද බලපෑම් සිදුකරන බව අවබෝධ කරගත යුතු ය. තෝමස් හොබ්ස්, ජෝන් ලොක්, ජීන් ජැක්වින් රූසෝ වැනි දේශපාලන දාර්ශනිකයන් ද සමාජ අසමානතාවෙන් ගොඩනැගෙන සමාජ පන්ති හෝ සමාජ ස්ථරය පිළිබඳ ගැටලුව පුළුල් ව සාකච්ඡා කර ඇත.

අධ්‍යාපනය හා සමාජ පන්තිය අතර පවතින ඒකාබද්ධතාව පරීක්ෂා කිරීමේ දී ඒ ඒ සමාජ පන්තියට අදාළ වන සමාජ ආර්ථික

තත්ත්වය යන සංකල්පය නිරවුල් ව අවබෝධ කර ගන්නා ප්‍රමාණය අනුව අධ්‍යාපනය සහ සමාජ පන්තිය අතර පවතින වෙන් කළ නොහැකි සම්බන්ධතාව හඳුනා ගත හැකි ය. යම් සමාජයක සමාජ ආර්ථික තත්ත්වය මගින් එම සමාජ පන්තියේ ආදායම පමණක් පිළිබඳ කථා නොකරයි. ඊට අමතර ව අධ්‍යාපනික ප්‍රාප්තිය, මූල්‍යමය ආරක්ෂාව මෙන් ම සමාජ තත්ත්වය යන සංකල්ප පිළිබඳ සංජානනයක් ඇති කරයි. තවද ජීවන උපලක්ෂණවල ගුණාත්මක භාවය සමාජය තුළ ඒ ඒ සමාජ පන්ති අත්කර ගන්නා අවස්ථා හා වරප්‍රසාද සමාජ ආර්ථික තත්වය යන සංකල්පයෙන් අවධාරණය කෙරේ. එපමණක් ම ද නොව "දරිද්‍රතාව" සමාජ ආර්ථික තත්ත්වය තුළ පවතින තවත් අංගයක් ලෙස විස්තර වේ. දරිද්‍රතාව යන්න තනි සාධකයක් නොවන බවත් එය බහුවිධ කායික හා මානසික ආතතීන්ගේ චර්යාවන්ගෙන් සමන්විත වේ. මේ අනුව පුද්ගලයෙක් නියෝජනය කරන සමාජ පන්තිය අත්කර ගන්නා සමාජ ආර්ථික තත්ත්වය පුද්ගලයෙකුගේ අධ්‍යාපන ප්‍රාප්තිය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරන බව තහවුරු වේ. යම් සමාජ පන්තියකට ආවේණික වන සමාජ ආර්ථික තත්ත්වය පුද්ගලයාට සිදුකරන බලපෑමෙන් ඔබ්බට ගොස් සමස්ත මානව ක්‍රියා ක්‍රියාකාරිත්වයට දැඩි බලපෑමක් එල්ල කරනු ඇත. ඉතා පහළ මට්ටමේ කායික, මානසික සෞඛ්‍ය පහළ මට්ටමේ අධ්‍යාපනික ප්‍රාප්තිය, දරිද්‍රතාව යන සාධක හා සමාජ ආර්ථික තත්ත්වය අතර සහසම්බන්ධතාවක් පවතින බව විද්වත් මතය වී තිබේ. මෙම කරුණු මඟින් අවධාරණය කරන්නේ අධ්‍යාපනය හා සම්බන්ධ වන මානසික හා කායික සෞඛ්‍යය මෙන් ම අනෙකුත් සාධක ද පුද්ගලයා නියෝජනය කරන සමාජ පන්තිය හා බැඳී පවතින ආකාරය යි. සමාජ පන්තිය හා එකට බැඳී ඇති සමාජ ආර්ථික තත්ත්වය (Social economic Status) අධ්‍යාපනය හා සම්බන්ධ ගැටලු නිර්මාණය කරන ආකාරය පර්යේෂකයන් අවධාරණය කරයි. මොර්ගන් සහ ෆාකාස් (Morgan & Farkas) පෙන්වා දෙන්නේ පහළ සමාජ ආර්ථිකයන්ට හිමිකම් කියන පවුල්වලින් හෝ ප්‍රජාව නියෝජනය කරන දරුවන් සමාජයේ ඉහළ සමාජ ආර්ථික නියෝජනය කරන දරුවන්ට වඩා අධ්‍යාපන සංවර්ධනයේ දී පහළ ශාස්ත්‍රීය කුසලතා හිමිකර ගන්නා බවයි. හිලිමියර් සහ මැක්සූ, (2009) (Hillemeier Maczuga, 2009)) අවධාරණය කරන්නේ ළමා අවධියේ දී පහළ සමාජ ආර්ථිකයකට

හිමිකම් කියන දරුවන් තුළ පහළ ප්‍රජානන හැකියා, භාෂා කුසලතාව, මතකය, සමාජ චිත්තවේගී සංවර්ධනය මෙන් ම වැඩිහිටි භාවයට පත්වන විට පහළ ආදායමකට හා පහළ සෞඛ්‍යයකට හිමිකම් කියන බවයි. එමෙන් ම පහළ සමාජ ආර්ථිකයන් තුළ ක්‍රියාත්මක වන පාසල් පද්ධතීන් හි ඉගෙනුම ලබන සිසුන් නිරන්තරයෙන් ම සම්පත් අගහිඟතාවයකට මුහුණ දෙන බවත් එම තත්ත්වය ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන සාධනයට මෙන්ම නිර්මාපී බවට ඍණාත්මක බලපෑම් ඇති කරන බව අයිකන්ස් සහ බාබරීන්, (2008) (Aikens & Barbarin, 2008) පෙන්වා දෙයි. සමාජ පන්ති නිර්මාණය වීමට සෘජු ලෙස ම දායක වන සමාජ ආර්ථික තත්ත්වය (Socio Economic Status) ළමයාගේ පවුලේ සම්පත් හා සමීප සම්බන්ධතාවයක් නිර්මාණය කරන අතර අනතුරුව එම සම්බන්ධතාවය ළමයාගේ අධ්‍යාපනික ප්‍රාප්ති කෙරෙහි විවිධ අයුරින් බලපෑම් එල්ල කරන බව පර්යේෂකයන් පෙන්වා දී ඇත. ඔවුන් දක්වන ආකාරයට ළමයා විධිමත් පාසල් අධ්‍යාපනයට ප්‍රවේශ වීමට පෙර සිට ම විවිධ සමාජ ආර්ථික තත්වයන් ට අයත් සමාජ පන්ති නියෝජනය කරමින් පැමිණෙන ළමයින් තුළ සාක්ෂරතා පරතර දක්නට ඇත. බකිංහැම් (Buckingham) ඇතුළු පර්යේෂකයන්ට අනුව පහළ සමාජ ආර්ථික පසුබිම් නියෝජනය කරමින් පැමිණෙන ළමයින් මූලික කියවීම, වචන උච්චාරණය, වාග්මාලාව, වාචික භාෂාව ආදී භාෂාව පිළිබඳ මූලික කුසලතා සඳහා යොමු කිරීමේ දී එම අත්දැකීම් ලබාගැනීමට අඩු උනන්දුවකින් කටයුතු කර ඇත. එම පර්යේෂකයන්ට අනුව ළමයින්ගේ මූලික කියවීමේ නිපුණතා හා ඔවුන්ගේ පවුල් අත්කරගෙන ඇති සාක්ෂරතාව අතර සහසම්බන්ධතාවක් පවතී. (Aikens & Barbarin). එසේ වුවත් ඉගෙනීමට ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය පොත්පත්, පරිගණක, උපස්ථම්භක සෙල්ලම් බඩු, කුසලතා සංවර්ධන පාඩම්, ඉගෙනුම් අත්දැකීම් ආදී ඉගෙනුම් ද්‍රව්‍යයන්ට යම් පමණකින් හෝ හිමිකම් කියන පහළ සමාජ පන්තිවල ද ධනාත්මක සාක්ෂරතා වාතාවරණ ගොඩනැගෙන බව පර්යේෂකයන් අනාවරණය කරගෙන ඇත.

පහළ සමාජ ආර්ථික තත්ත්වයන්ට හිමිකම් කියන සමාජ පන්ති නියෝජනය කරන ළමයින් අධ්‍යාපන ක්‍රියාවලියේ දී සෙමෙන් වර්ධනයක් අත් කර ගන්නා අතර ම ශාස්ත්‍රීය ජයග්‍රහණ අත්කර ගැනීමේ දී පහළ මට්ටමක් පෙන්වීම යන පර්යේෂණ අනාවරණ ඉහළ

සමාජ ආර්ථික තත්වයන් ට හිමිකම් කියන ළමයින්ගේ මට්ටම් සමග සංසන්දනාත්මකව විග්‍රහයක යෙදී ඇත. එහිදී පහළ සමාජ ආර්ථික තත්ත්ව සහිත සමාජ පන්ති නියෝජනය කරමින් සාමාන්‍ය සාක්ෂර කුසලතා සහිත ව උසස් පාඨශාලාවලට ඇතුළත් වන සිසුන් ඉහළ සමාජ ආර්ථික තත්ත්ව සහිත සමාජ පන්ති නියෝජනය කරන සිසුන්ට වඩා ශාස්ත්‍රීය දැනුම් අතින් වසර පහක් පිටුපසින් සිටින බව පවසයි (රෙයාර්ඩන් ඇතුළු පිරිස, 2013).

තවද පහළ සමාජ ආර්ථික පසුබිම්කට හිමිකම් කියන සමාජ පන්ති නියෝජනය කරමින් උසස් පාඨශාලාවලට ඇතුළත් වන සිසුන්ගෙන් සියයට එකොළහයි දශම හයක් (11.6%) ක් පාසලෙන් විපතනයට ලක් වූව ද ඉහළ සමාජ ආර්ථික තත්ත්ව නියෝජනය කරමින් පාසල් ගතවන සිසුන්ගෙන් සියයට දෙකයි දශම අටක් (2.8%) පමණක් පාසලෙන් විපතනය වේ. තවද විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිතය යන විෂයන් පිළිබඳ සාර්ථකත්ව අනුපාතය ඉහළ සමාජ පන්ති නියෝජනය කරන සිසුන් ඉහළ අනුපාතයකින් ද පහළ සමාජ පන්ති නියෝජනය කරන සිසුන් පහළ අනුපාතයකිනුත් අත්කර ගන්නා බව පෙන්වා දෙයි (Doerschuk etal, 2016). ඇමරිකානු සංගණන කාර්යාංශයට අනුව වයස අවුරුදු විසි හතරක් වන විට ප්‍රථම උපාධිය ලබා ලබා ගන්නා පුද්ගලයන්ගේ සංඛ්‍යාව පහළ ආදායම් සහිත පවුල්වල දරුවන්ට වඩා අට ගුණයකින් ඉහළ ආදායම් සහිත පවුල්වල දරුවන් ප්‍රථම උපාධිය ලබා ගනියි (US ensues Bureau, 2014).

ඒ. එච් හල්සේ (A.H.Halsey) ඇතුළු පර්යේෂණ කණ්ඩායම උපුටා දක්වන චන්ද්‍රා ගුණවර්ධන සමාජ පන්තිය වඩා උසස්වත්ම අධ්‍යාපන සාධන මට්ටම ද වඩා ඉහළ යන බව පෙන්වා දෙයි. වඩා උසස් සමාජ පන්තිවල දරුවන් පශ්චාත් ද්විතීය අධ්‍යාපනයෙහි රැඳී සිටීමේ ප්‍රවණතාව වැඩි බවත් විශ්ව විද්‍යාලයට ප්‍රවේශ වීමේ ඉඩ ප්‍රස්ථාව වැඩි බවත් ප්‍රකාශ කරයි (1995: 48).

ඉහතින් දක්වන්නට යෙදුණු සමාජ පන්තිය (Social Class) නිර්මාණය වීමට මූලික වන සමාජ ආර්ථික සාධක ඒ අයුරින් ම සමාජ පන්තියක් නියෝජනය කරන පුද්ගලයන්ගේ අධ්‍යාපනය පිළිබඳ

තීරණ ගැනීමට, අධ්‍යාපන ක්‍රියාවලිය නිරතවීමට හෝ නොවීමට හේතු වන බව පැහැදිලි ය. අධ්‍යාපනය හා සමාජ පන්ති අතර පවතින අන්‍යෝන්‍ය බැඳීම් මෙරට අධ්‍යාපන රටාවෙන් ද මනාව ප්‍රකට කරයි. ශ්‍රී ලංකාවේ ද ග්‍රාමීය ප්‍රදේශවල දක්නට ලැබෙන සමාජ ආර්ථික තත්වය (Socio economic Status) බොහෝ සෙයින් සමාන ලක්ෂණ ගනියි. කෘෂිකර්මාන්තය මූලික කරගත් යැපුම් කෘෂි කර්මාන්තයකට හිමිකම් කියන ග්‍රාමීය ජනතාව එක් සමාජ පන්තියකට ගොනුවේ. එලෙස ගොනුවන ජනතාව අධ්‍යාපනය සම්බන්ධ සමාන ගැටළුවලට මුහුණ දෙන ආකාරය ආනුභවික තත්ත්වයකි. උදාහරණ ලෙස මෝසම් වැසි සමග ආරම්භ වන කෘෂිකාර්මික කටයුතුවල දී ශ්‍රමය ලබා ගැනීමේ දී දෙමව්පියන්ට දරුවන්ගේ ශ්‍රමය පිළිබඳ බලාපොරොත්තු තබා ගැනීමට සිදුවේ. තම ජීවත් වීමේ මාර්ගය කෘෂිකර්මාන්තය බවත් එම කටයුතු නිසි කලට නිම කළ යුතු බවත් ඔවුන් දනී. එබැවින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු දෙවන ස්ථානයටත්, කෘෂිකාර්මික කටයුතු පළමු ස්ථානයට පත්වේ. එහෙත් ව්‍යාපාරික කෘෂිකර්මාන්තයට සම්බන්ධ සමාජ පන්ති තුළ ඉහත තත්ත්වය විරුද්ධ ලෙස ක්‍රියාත්මක විය හැක. මේ අනුව එක් එක් සමාජ පන්තියට සාපේක්ෂව අධ්‍යාපනය ක්‍රියාත්මක වන බවත් අධ්‍යාපන ක්‍රියාවලියේ දී අධ්‍යාපනය ත් සමාජ පන්තියක් වෙන් වෙන් වශයෙන් ගෙන සාකච්ඡා කිරීමට නොහැකි බව තහවුරු වේ. මෙහි දී සමාජ පන්තියක් නිර්මාණය වීම සඳහා සමාජ ආර්ථික තත්ත්වය හේතු වන ආකාරයට ම පුද්ගලයෙකුගේ අධ්‍යාපන ප්‍රවේශය හා ඉදිරියට පවත්වාගෙන යාමේ දී යම් සමාජ පන්තියක සමාජ ආර්ථික තත්ත්වය සෘජු බල බලපෑම් ඇති කරන බව අවධාරණය කරයි.

**සමාජ පන්තිය හා අධ්‍යාපනික ජයග්‍රහණ**

සෑම සමාජ පංතියක් ම එම පන්තිය නියෝජනය කරන සිසුන්ගේ අධ්‍යාපනික ජයග්‍රහණ හා ප්‍රාප්තිය කෙරෙහි ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. අධ්‍යාපන පද්ධතිය නියෝජනය කරන සෑම වයස් කාණ්ඩයක දී ම වැඩ කරන පංතිය (Working Class) නියෝජනය කරන දරුවන් මැද පන්තියේ (middle class) දරුවන්ට වඩා අඩු කාර්ය සාධනයක් අත්කර ගන්නා අයුරක් විද්‍යමාන වේ. අධ්‍යාපන පද්ධතියේ ඇති අගතිගාමී ස්වභාවයත්, පද්ධතිය වරප්‍රසාද

ලත් කණ්ඩායම් අරමුණු කොට ක්‍රියාත්මක වීමත් මැද පන්තියේ ළමයින් විසින් වැඩ කරන පන්තියේ ළමයින්ගේ හා සුළු ජන කොටස් නියෝජනය කරන දරුවන්ගේ අවශ්‍යතා පිළිබඳ සැලකිළිමත් නොවීම එම තත්වයට හේතුවන බවට කරුණු ඉදිරිපත් කරයි (C.N.Trueman, 2015). කෙසේ නමුත් පර්යේෂකයන්ගේ අනාවරණයන්ට අනුව සෑම සමාජ පන්තියකට ම හැකියා පිළිබඳ සමාන ලක්ෂණ ඇති බවත්, සමාජ පන්තිය හා බැඳුණු බුද්ධිමය හැකියා අඩු කාර්ය සාධනයට හේතු නොවන බවත්, ඊට වෙනත් සාධක බලපාන බවත් පෙන්වා දෙයි. ඒවා අතර පහළ මට්ටමේ අපේක්ෂණ, ප්‍රාර්ථනා, සන්තෝෂය හා ආර්ථික ගැටලු ප්‍රධාන වන බව පවසයි. බුද්ධි ඵලය නොවෙනස් ව පවතින විට ද විවිධ සමාජ පන්තිවල සාමාජිකයන්ගේ අධ්‍යාපන ප්‍රාප්ති මට්ටම වෙනස් විය හැකි අයුරු බොහෝ අධ්‍යයන මගින් පෙන්වා දී ඇත. මධ්‍යම පන්තික ශිෂ්‍යයන් හා සමාන බුද්ධි තලයක් ඇති කම්කරු පන්තික සිසුහු අධ්‍යාපන ක්‍රමය තුළ එතරම් සාර්ථක නොවෙති. මේ නිසා සමාජ පන්තිවල විශේෂ ප්‍රතිමාන හා වටිනාකම් හා උපසංස්කෘති අධ්‍යාපන ක්‍රමය තුළ සිසුන්ගේ ප්‍රාත්තිය තීරණය කරන බව පර්යේෂකයන් පෙන්වා දී ඇත (ගුණවර්ධන, 1995: 82). වැඩ කරන පන්තිය නියෝජනය කරන ළමයින් අනෙක් සමාජ පන්ති නියෝජනය කරන ළමයින්ට වඩා ආර්ථික අපහසුතා අත්දකින බවත්, එයින් අධ්‍යාපනය හා සම්බන්ධ ද්‍රව්‍යමය අගහිඟකම් ජීවිතය පුරා අත්දකින බව පවසයි. එම තත්වය අධ්‍යාපනයේ අඩු ජයග්‍රහණ හෝ කාර්ය සාධනයට හේතුවන බව තම පර්යේෂණ මගින් තහවුරු කරයි (C.N.Trueman, 2015). මේ අනුව පහළ සමාජ පන්ති නියෝජනය කරන ළමුන් අත් දකින අගහිඟකම් අධ්‍යාපනික අවශ්‍යතා අහිමි කිරීමත් ඒ තුළින් ඉහළ කාර්ය සාධනයක් අත්කර ගැනීමට අවශ්‍ය වන ශක්තිමත් ආකල්ප වෙනුවට ඔවුන් තුළ දුර්වල ආකල්ප තහවුරු කිරීමට හේතුවන බව පෙන්වා දෙයි.

අධ්‍යාපනය හා සමාජ පන්තිය හා සංකල්ප පිළිබඳ ඉහළින් කරන ලද විභාගවලින් පෙනී ගියේ පුද්ගලයන් නියෝජනය කරන සමාජ පන්තිය පුද්ගලයාගේ සමස්ත අධ්‍යාපනයට සෘජු මෙන් ම දැඩි බලපෑම් එල්ල කරන ආකාරයයි.ඒ සඳහා පුද්ගලයෙකු අයත් වන සමාජ ආර්ථික තත්වය (Social Economic Status) විවිධ ආකාරයෙන් සිදු කරන බලපෑම විමසා බලන ලදී. එමෙන් ම සමාජ පංතිය ළමුන්ගේ

අධ්‍යාපනික කාර්ය සාධනය සඳහා සමාජ පන්තිය (Social Class) සිදු කරන බලපෑම සාකච්ඡා කළ අතර ඒ සියල්ල සමාජ සාධක ලෙස හඳුනා ගනී. එම සාධක වලට අමතරව සමාජ පන්ති අනුව එකිනෙකට වෙනස් වූ ආධ්‍යාපනික කාර්ය සාධන අත්කර ගැනීම සඳහා පාසල් අභ්‍යන්තර සාධක බලපාන ආකාරය පහත ඡේදයෙන් විමසා බැලේ.

සමාජ පන්තිය අනුව සිසුන් ලබා ගන්නා අධ්‍යාපනික කාර්ය සාධනය තීරණය වීමට බලපාන බාහිර සාධක මෙන් ම පාසල අභ්‍යන්තර සාධක ද දැඩි බලපෑමක් එල්ල කරන බව අන්තර් ක්‍රියා කරන සමාජ විද්‍යාඥයන් පෙන්වා දෙයි. ඔවුන් දක්වන ආකාරයට අධ්‍යාපනික කාර්ය සාධනයට බලපෑම් කිරීමට සමාජ පන්ති ව්‍යූහයක් ම අවශ්‍ය නොවන බවත්, ඒ සඳහා පාසල්වල ගුරුවරු සහ සිසුන් අතර පවතින සම්බන්ධතාව හා අන්තර් ක්‍රියාකරණය හේතුවන බව පෙන්වා දෙයි. නව මාක්ස්වාදීන් ද අන්තර් ක්‍රියාකරණවාදීන්ගේ මෙම අදහස තහවුරු කරන අතර, ගුරු සිසු සබඳතාව සැලකිය යුතු බලපෑමක් අධ්‍යාපනික ප්‍රාප්තියට සිදු කරන බව දක්වයි. ඔවුන්ට අනුව ගුරුවරුන් විසින් පාසලේ සිසුන් කෙරෙහි සිදුකරන හන්වඩු න්‍යාය (Labelling Theory) ඊට හේතුවේ. වර්තමාන පාසල් පද්ධතිය තුළ මෙම න්‍යායට ලක්වන පිරිස වන්නේ සමාජයේ පහළ සමාජ පන්ති නියෝජනය කරමින් පාසලට පැමිණෙන සිසුන් වේ. පහළ සමාජ පන්ති නියෝජනය කරන මෙම පිරිස නිරන්තරයෙන් අත් විඳින පහළ ජීවන අවස්ථා (Life Chances) නිසා පාසල තුළ අනෙක් ළමුන්ට සාපේක්ෂ ව මෙම ළමයින් පසුබටතාවක් ප්‍රදර්ශනය කරයි. එවන් අවස්ථාවලදී එම තත්වය අවබෝධ නොකරගන්නා ගුරු භවතුන් අතින් මෙවන් හන්වඩු ගැසීම් සිදුකරන අවස්ථා දැකගත හැක. එහි දී සමහර ළමුන් දක්ෂයෝ හොඳ චරිතවත් ලෙසත්, තවත් අයෙක් කළහකාරී නරක මෝඩ ආදී වශයෙන් හන්වඩු ගැසීමටත් ලක් වේ. මෙහි දී සෘණාත්මක බලපෑමට ලක්වන සිසුන්ගේ අධ්‍යාපනික සාධනය දුර්වල වන බව පෙන්වා දෙයි. මෙහි දී ද පහළ සමාජ පන්ති නියෝජනය කරන සිසුන් මෙම අසාධාරණයට ලක්වෙන බවත් එහි දී ද පහළ සමාජ පන්ති නියෝජනය කරන පිරිමි ළමුන් වැඩි වශයෙන් අපහසුතාවට පත්වෙන බවත් පෙන්වා දෙයි.

අධ්‍යාපනයේ සමාජ විද්‍යාව විෂය ක්ෂේත්‍රය තුළ අධ්‍යයනයට ලක්වෙන සමාජ පන්තිය හා අධ්‍යාපනය යන සංකල්ප දෙක එකිනෙකට බද්ධ ව ඇති ආකාරයත්, එම සංකල්ප දෙකෙන් සමාජ පන්තිය පුද්ගලයකු ලබන අධ්‍යාපනයට සිදු කරන බලපෑමත්, සමාජ පන්තිය නිර්මාණය වීමට දායකවන සමාජ ආර්ථික තත්ත්වය (Social Economic Status) රටක අධ්‍යාපනය කෙරෙහි සිදු කරන බලපෑමත් ඉහත පැහැදිලි කිරීම් මගින් අනාවරණය කර ගැනීමට අවස්ථාව උදාවෙනු ඇත. පුද්ගලයකුගේ අධ්‍යාපනය කෙරෙහි සමාජ පන්තිය තීරණාත්මක බලපෑමක් එල්ල කළ ද පුද්ගලයකුට තම සමාජ පන්තිය වෙනස් කර ගැනීමට අධ්‍යාපනය ප්‍රබල අවියක් ලෙස යොදා ගත හැකි බව සිහිපත් කරමින් සමාජ පන්තිය හා අධ්‍යාපනය පිළිබඳ කරුණු දැක්වීම නිමා කරමි.

## ආශ්‍රිත ග්‍රන්ථ


ගුණවර්ධන චන්ද්‍රා. (1995). *අධ්‍යාපනය හා සමාජ සාධක.* කොට්ටාවඃ සාරප්‍රකාශන.

ගලගමගේ එස්. (2016). *අධ්‍යාපන සමාජවිද්‍යා මූලධර්ම,* පන්නිපිටියඃ කර්තෘ ප්‍රකාශන.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.* කොළඹ 07, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

Bhathiya,K.K.(1981). *Principles of Education*. New Delhi:Kalyani publishers.

Education and socioeconomic status factsheet; https://www.apa.org/pi/ses/resources/publications/education

BY The Editorsof Encyclopaedia Britannica View Edit History https://wwwbrita nica.com/topic/social-class

Social class Definition,Theories & Facts/Britanica, https://www.britannica.com/topic/social-class

Status Group, https://en.wikipedia.org/wiki/Status_group

TruemanC.N.,SocialClassandAchievement;https://www.historylearningsite.co.uk/sociology/education-and-sociology/social-class-and-achievement/

The Report & Education for All (EFA) https://en.unesco.org/gem-report/report-education-all-efa

Differential Educational Achievement by Social Class - In School Factors;

https://www.tutor2u.net/sociology/reference/differential-educational-achievement-by-social-class-in-school-factors